බුත්තල ප්‍රාදේශීය සභාවේ - 2021
--------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුත්තල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** <u>**වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** <u>**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**</u>

**1.6.1** <u>**ගිණුම්කරණ අඩුපාඩු**</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වටිනාකම රු.159,000 ක් වූ හා රු.109,760 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රය, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම් ගතකර තිබුණි.<br><br>(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු තථ්‍ය උසාවි දඩ ආදායම රු.883,512 ක් වුවද එය රු. 504,679 ක් ලෙස ගිණුම් ගතකිරීම හේතුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම හා මෙහෙයුම් අතිරික්තය රු. 378,833 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු තථ්‍ය මුද්දර ගාස්තු ආදායම රු. 746,330 ක් වුවද එය රු. 514,488 ක් ලෙස ගිණුම් ගතකර තිබීමෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හා මෙහෙයුම් අතිරික්තය රු. 231,842 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | වර්ෂය අවසානයේ ලැබිය යුතු ආදායම්වල නිවැරදි වටිනාකම ගිණුම්වලට ගලපා ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති වටිනාකම රු. 1,299,155 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබීමෙන් ජංගම වත්කම් සහ අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට එක් කර්මාන්ත ණය හිමියෙකුට ගෙවිය යුතු රු. 480,595 ක් රු. 406,226 ක් ලෙස ගිණුම් ගතකර තිබීමෙන් කර්මාන්ත ණයහිමියෝ රු. 74,369 ක් අඩුවෙන් සහ අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදි ගිණුම් සකස්කරන විට නිවැරදි කරන බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛන/ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 344,691 ක වෙනසක් නිරීක්ෂණය විය. | උපලේඛන නිවැරදි කරන බව දන්වා ඇත. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීනකර නොසැසඳීම් වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,269,244 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,618,055 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

**2.2.1** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයට අදාලව රු. 1,714,801 ක සහ සමාලෝචිත වර්ෂයට අදාලව රු. 813,373 ක හිඟ වරිපනම් බදු අයකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කර ඇති බව දන්වා ඇත. | බිල් කරන ලද ආදායම් අයකරගත යුතුය. |
| (ආ) සභාව විසින් දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 67 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ අංක එම්ඕ/ආර්ඩී/498 දරන 2018 ජූලි 24 දිනැති තක්සේරුව අනුව කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා අරමුදලට රු. 18,166,200 ක ආදායමක් අහිමි වී තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවාගෙන කඩ කුලී අයකරන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා ඇති බව සඳහන් කර ඇත. | නව තක්සේරුව අනුව කඩකුලී අයකරගත යුතුය. |
| (ඇ) සභාවට අයත් මෝටර් ග්‍රේඩර්,ටිපර් රථ, බැකෝ ලෝඩර් යන්ත්‍ර සහ ලොරි බවුසර් රථ බාහිර පාර්ශ්වයන් 164 ක් වෙත කුලියට දීමේදී ඒ වෙනුවෙන් ප්‍රමාණවත් අත්තිකාරම් මුදලක් අයකර නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව රු.3,753,662 ක් සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් රු. 5,008,912 ක කුලී ආදායම් අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | හිඟ මුදල් ඉදිරියේ දී අයකර ගන්නා බව දන්වා ඇත. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |